A)

1. බහුවරණ ප්‍රශ්න පත්‍රයක පිළිතුරු පත්‍රයක් කියවිය හැක්කේ,
(1) සංඛ්‍යාංකකය (Digitizer) මඟිනි.
(2) ආලෝක පෑන (Light Pen) මඟිනි.
(3) චුම්බක තීන්ත අනුලක්ෂණ කියවනය (Magnetic Ink Character Reader) මඟිනි.
(4) පරිලෝකකය (Scanner) මඟිනි.
(5) විකුණුම්පොළ (Point Of Sale) ටර්මිනලය මඟිනි. ***(2011, Q 3)***

2. සම්ප්‍රේෂිත ස්ඵන්දනයෙහි ප්‍රතිධ්වනිය භාවිත කෙරෙන පරිගණකගත වෛද්‍ය අනුරූකරණ පද්ධති
(1) CAT ස්කෑන් නම් වේ. (2) CT ස්කෑන් නම් වේ.
(3) PETT ස්කෑන් නම් වේ. (4) පාරධ්වනි (Ultrasound) ස්කෑන් නම් වේ.
(5) X කිරණ අනුරුව නම් වේ. ***(2011, Q 4)***

3. දත්ත සහ තොරතුරු පිළිබඳ ව පහත දක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
A - '101011101' යන සංකේත
B - සංඛ්‍යා අනු සලකුණු සහ ප්‍රතිබිම්බ
C - අධ්‍යයනයක් ඇසුරෙන් ව්‍යුත්පන්න කරන ලද කරුණු
D - ග්‍රාහකයන්ට අර්ථවත් වනසේ සකසන ලද කරුණු
ඉහත දක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ මඟින්, තොරතුරු වඩාත් හොඳින් විස්තර කරනු ලබන්නේ ද?
(1) D පමණි. (2) A සහ B පමණි. (3) C සහ D පමණි. (4) A, B සහ C පමණි. (5) B, C සහ D පමණි. ***(2012,Q 4)***

4. පහත දැක්වෙන පද සලකා බලන්න.
A - ආදානය (Input) B - ප්‍රතිදානය (Output) C - ක්‍රියාවලිය (Process) D - ආචයනය (Storage)
(1) A සහ B පමණි. (2) A, B සහ C පමණි. (3) A, C සහ D පමණි. (4) B, C සහ D පමණි. (5) A, B, C සහ D පමණි.
(2012, Q 34)

5. දත්ත හා තොරතුරු සම්බන්ධයෙන් පහත සඳහන් කවර වගන්තියක් සත්‍ය වන්නේ ද?
(1) තීරණයක් ගැනීම සිදු කළ හැක්කේ අතිමහත් වූ දත්ත ප්‍රමාණයක් පවතින විට ම පමණි.
(2) තොරතුරුවල වලංගුතාව, දත්තවල නිරවද්‍යතාව මත රඳා පවතී.
(3) දත්ත සැකසුමෙන් ලබා ගන්නා තොරතුරු සැමවිට ම නිරවද්‍ය වේ.
(4) තොරතුරු ලබා ගැනීම සඳහා බහු ප්‍රභව මඟින් දත්ත එකතු කළ යුතු වේ.
(5) තොරතුරුවල නිරවද්‍යතාව රඳා පවතිනුයේ ආදාන දත්තවල නිරවද්‍යතාව මත පමණි. ***(2013, Q 31)***


6. පහත සඳහන් ශිල්පීය ක්‍රම සලකන්න.
A - පරිගණක සහායිත ඉගෙනුම (Computer Aided Learning - CAL)
B - පරිගණක පාදක ඉගෙනුම (Computer Based Learning - CBL)
C - පරිගණක පාදක ඇගයීම් (Computer Based Assesment - CBA)

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාදක ඉගෙනුම් හා ඉගැන්වීම්වල දී ඉහත දක්වා ඇති කුමන ශ්ලිපීය ක්‍රම භාවිත වන්නේ ද?
(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C සියල්ලම ය. ***(2013, Q 32)***

7. 2014, T-20 ලෝක කුසලාන තරඟාවලිය ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම විසින් දිනාගන්නා ලදී. ශ්‍රී ලංකා ක්‍රිකට් ලෝලීන් හට මෙම තොරතුර වඩාත් ඉහළ ම අගයක් ගෙන දුන්නේ,.....
(1) අවසන් තරගය ආරම්භ කළ විට දී ය. (2) තිසර පෙරේරා ජයග්‍රාහී ලකුණ ලබාගත් විට දී ය.
(3) නායක ලසිත් මාලිංගට කුසලානය ලැබුණු විට දී ය. (4) ඔවුහු පුවත්පත් මඟින් ප්‍රවෘත්තිය දැනගත් විට දී ය.
(5) ඔව්හු ක්‍රිකට් කණ්ඩායම කටුනායක ගුවන් තොටුපලේ දී දැක ගත් විට දී ය. ***(2014, Q 9)***

8. පරිගණක පද්ධතිය හා සම්බන්ධ පහත සඳහන් පද සලකා බලන්න.
A - අනිෂ්ට මෘදුකාංග (Malware) B - දෘඪාංග (Hardware)
C - මෘදුකාංග (Malware) C - ජීවාංග (Liveware)
පරිගණක පද්ධතියක මූලික සංරචක වන්නේ ඉහත සඳහන් දෑ අතුරෙන් කවරක් ද?
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා D පමණි.
(4) B හා C පමණි. (5) B , C හා D පමණි. ***(2015, Q 21)***

9. තොරතුරු සම්බන්ධයෙන් ස්වර්ණමය නීතිය (Golden rule) වඳහා දක්වන්නේ පහත දක්වා ඇති කුමන ප්‍රස්තාරයෙන් ද?



(2015, Q 35)

10. පහත සඳහන් වගන්ති සලකන්න.

A - රචනා චෞරත්වය (Plagiarism) තොරතුරු පද්ධතිවලට ඇති පොදු තර්ජනයකි.
B - රචනා චෞරත්වයෙන් අදහස් වන්නේ වෙනත් අයකුගේ නිර්මාණයක් තමුන්ගේ යැයි කියා පෑමයි.
C - ප්‍රකාශන සොරකම (Piracy) රචනා චෞරත්වය සඳහා සමානාර්ථ පදයකි.
ඉහත වගන්ති අතුරෙන් නිවැරදි වන්නේ කවරක් ද?

(A) A පමණි (2) B පමණි (3) C පමණි (4) A හා B පමණි (5) B හා C පමණි *(2016, Q 10)*

11. පහත ඒවා අතුරෙන් **අත්‍යුරු කාවකාලික** දත්ත ගබඩාවක් සඳහා වඩාත් යෝග්‍යතම උදාහරණය කුමක් ද?

(1) ගොනු බන්දේසියක් (2) කාඩ්බෝඩ් ගොනුවක්
(3) ගොනු කැබිනෙට්ටුවක් (4) දෘඪ ඩිස්කයක තිබෙන දත්ත ගොනුවක්
(5) දෘඪ ඩිස්කයක තිබෙන කාවකාලික දත්ත ගොනුවක් *(2016, Q 33)*

12. පරිලෝකකය (scanner) සම්බන්ධයෙන් පහත සඳහන් කවර වගන්තිය නිවැරදි වන්නේ ද?

(1) පරිලෝකකය යනු මුද්‍රිත ලේඛනයක් පරිලෝකනය කර සංඛ්‍යාංක අනුරූපක (digital images) බවට පරිවර්තනය කරනු ලබන මෘදුකාංගයකි.
(2) පරිලෝකකය යනු පරිගණකයක ප්‍රතිදාන උපක්‍රමයකි. (output device).
(3) ප්‍රකාශ අනුලක්ෂණ කියවන (optical character reader (OCR) මෘදුකාංගය පරිලෝකකයක අත්‍යවශ්‍ය අංගයකි.
(4) පරිලෝකකය පරිගණකයක ආදාන උපක්‍රමයකි. (input device)
(5) සංචලන රූප අංකිත ආකාරයට ආචයන කිරීම සඳහා පරිලෝකකය භාවිත කරනු ලැබේ. *(2016, Q35)*

13. එක්තරා පාසලක සිසුන්ගේ අධ්‍යාපන කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ඔවුන්ට tablet පරිගණක ලබා දෙන ලදි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වඩාත් ම සුදුසු වන්නේ පහත ක්‍රියාකාරකම්වලින් කුමක් ද?

(1) පරිගණකගත අධ්‍යාපනික ද්‍රව්‍ය බාගත කිරීම (2) විනෝදාත්මක වීඩියෝ නැරඹීම
(3) මිතුරන් අතර ක්ෂණිකව පණිවිඩ යැවීම (4) බ්ලොග් ලිවීම
(5) පරිගණක ක්‍රීඩාවල යෙදීම *(2017, Q 27)*

14. පහත දැක්වෙන දත්ත ආදාන උපාංග සලකන්න:

A - තිරය මත දක්වෙන යතුරු පුවරුව (virtual keyboard)
B - තීරු කේත කියවනය (bar code reader)
C- චුම්බක කාඩ්පත් කියවනය (Magnetic card reader)
වඩාත් කාර්යක්ෂමව දත්ත ආදාන කිරීම සඳහා ඉහත කවර උපාංග භාවිත කළහැකි ද?

(1) A පමණි (2) B පමණි (3) C පමණි (4) A හා B පමණි (5) B සහ C පමණි. *(2017, Q 39)*

15. පහත කවරක් 'ටෙලිගමනය' (telecommuting) යන පදය පැහැදිලි කරයි ද?

(1) සේවකයකුට එකිනෙකට වෙනස් භූගෝලීය ස්ථානවල සිට නවීන තාක්ෂණය භාවිතයෙන් රාජකාරිය පහසුවෙන් කිරීමට ඇති හැකියාව.
(2) විවිධ භූගෝලීය ස්ථානවල සිටින පුද්ගලයින් සමග මාර්ගගත (online) රැස්වීම් පවැත්වීම
(3) සමාජ සත්කාරය සඳහා ICT භාවිත කිරීම
(4) තොරතුරු සමුද්ධරණය (retrive) කිරීම සඳහා වෙබ් පාදක කරගත් යෙදුම් භාවිතය
(5) මූල්‍ය ගනුදෙනු මාර්ගගතව සිදු කිරීම *(2018, Q 3)*

16. වර්ෂ 1969 දී ප්‍රථමවරට මිනිසකු සඳ මත පා තැබීම සඳහා වූ අභ්‍යාවකාශ වාරිකාව සලකන්න. මෙම සම්පූර්ණ ක්‍රියාදාමය නිරවද්‍යතයින් කිහිප දෙනෙකු විසින් ශ්‍රී ලංකාව සහ ඇමරිකා එක්සත් ජනපදය තුළ සිටිමින් ශ්‍රී ලංකා කුවන් විදුලියෙන් විකාශනය කරන ලදී. පහත සිදුවීම් අතුරෙන් කුමකින් ඉහළම තොරතුරු අගය දක්වෙයි ද?

(1) අභ්‍යාවකාශ මටලය රැගත් රොකට්ටුව පෘථිවියෙන් පිටත්වීම සඳහා පහළට ගිණීම (counting down)
(2) අභ්‍යවකාශ මටලය පෘථිවි ගුරුත්වාකර්ෂණ ක්ෂේත්‍රයෙන් මිදෙන මොහොත
(3) අභ්‍යාවකාශ මටලය චන්ද්‍ර ගුරුත්වාකර්ෂණ ක්ෂේත්‍රයෙන් මිදෙන මොහොත
(4) ගගනගාමී නීල් ආම්ස්ට්‍රෝන් තම පළමු පියවර සඳ මත තැබූ මොහොත
(5) ආපසු පෘථිවිය කරා පැමිණීමේ දී ගගනගාමීන් සාගරයට පතිත වූ මොහොත

(2018, Q 18)

17. කාලයත් සමඟ පරිගණකවල සංවර්ධනයට අදාළ පහත ප්‍රකාශ සලකන්න.

A - පරිගණකවල සකසන වේගය සහ විදුලි පරිභෝජනය යන දෙක ම වැඩි වී ඇත.
B - පරිගණකවල සකසන වේගය වැඩි වූ අතර පරිගණකයක භෞතික ප්‍රමාණය අඩු වී ඇත.
C - පරිගණකවල විදුලි පරිභෝජනය සහ භෞතික ප්‍රමාණය යන දෙකම අඩු වී ඇත.

ඉහත කවර වගන්තියක්/වගන්ති නිවැරදි වේ ද?

(1) A පමණි (2) A හා B පමණි (3) A හා C පමණි
(4) B හා C පමණි (5) A, B හා C සියල්ලම

(2018, Q 19)

18. පහත දී ඇති වගන්ති සලකන්න.

A - වාහන සේවා ස්ථානයක් මඟින් පරිගණකයෙහි ඇති පාරිභෝගිකයන්ගේ පෞද්ගලික තොරතුරු රක්ෂණ නියෝජිතයකුට ලබාදීම පාරිභෝගිකයන්ගේ පෞද්ගලිකත්වයට (privacy) අදාළ ගැටලුවකි.
B - තනි පරිශීලක බලපත්‍ර සහිත මෘදුකාංගයක පිටපතක් වෙනත් පාර්ශ්වයකට ලබා දීම මෘදුකාංගයෙහි හිමිකම් අයිතිකරුට (copyright owner) අදාළ වන චෞරත්වය (piracy) ගැටලුවකි.
C - වෙනත් අයෙකුගේ පරිගණකයකට අනවසරයෙන් ප්‍රවේශ වීම නීතිමය මෙන්ම සදාචාරාත්මක ද ගැටලුවකි.

ඉහත ප්‍රකාශ අතුරෙන් කවරක් වලංගු වේ ද?

(1) A පමණි (2) B පමණි (3) A හා B පමණි
(4) B හා C පමණි (5) A, B හා C සියල්ලම

(2018, Q 20)

19. අවශ්‍යතා මත සැකසූ මෘදුකාංග (off-the-sale sofware) සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත සඳහන් කුමක් ද?

(1) මෙය සැමවිටම සියලු පරිශීලකයින්ගේ අවශ්‍යතා සපුරාලයි.
(2) සැමවිටම මිල ඉතා ඉහළ වේ.
(3) මෙවැනි මෘදුකාංගයක නිෂ්පාදන පිරිවැය (cost) මිලදී ගන්නන් බොහෝ දෙනෙකු අතර ඵලදායී ලෙස බෙදී යයි.
(4) මෙම මෘදුකාංග සැලසුම් කර ඇත්තේ තනි සේවාදායකයෙකුගේ අවශ්‍යතාවයන්ට ය.
(5) අසමත් වීමේ (failure) අවදානම ඉතා ඉහළ වේ.


(Prototype Paper 2019, Q 12)

20. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් (ICT) සමාජයට වන ප්‍රතිලාභයක් වන්නේ පහත සඳහන් ඒවායෙන් කුමක් ද?

(1) සිසුවකුට අන්තර්ගතය වෙත ඕනෑම වේලාවක දී පිවිසිය හැකිවීම.
(2) සිසුවකුට අන්තර්ගතය වෙත ඕනෑම ස්ථානයක සිට පිවිසිය හැකිවීම.
(3) සියලු දෙනාටම සම අධ්‍යාපන අවස්ථා සැලසීම.
(4) සහයෝගී ඉගෙනුමට සහායවීම.
(5) ඕනෑම අයෙකුට ඕනෑම දෙයක් පළකිරීමට ඇති ඉඩ.

(Prototype Paper 2019, Q 38)

21. කිසියම් මෙහෙවරක (mission) සිද්ධි පහක තොරතුරුවල අගය සමඟ වෙනස්වන ආකාරය කාලානු ක්‍රමයට රූපසටහනෙහි පෙන්වා ඇත. සමස්ත මෙහෙවරෙහි තොරතුරු, විශේෂයෙන් ම එක් එක් සිද්ධිය සිදුවන අවස්ථා, මාර්ගගතව තථ්‍ය කාලීනව (real time) ඉදිරිපත් කරන ලදී.



ඉහත මෙහෙවර පිළිබඳ පහත වගන්ති සලකන්න.

A - P, Q සහ R සිද්ධි පමණක් තොරතුරු පිළිබඳ ස්වර්ණමය රීතියට (Golden Rule of Information) අනුකූල වේ.
B - S සිද්ධියට වැඩිම ඉල්ලුමක් ඇති අතර එයට වැඩිම තාක්ෂණික සම්පත්වලින් පහසුකම් සැලසීම අවශ්‍ය වේ.
C - කිසියම් සිද්ධියක තොරතුරු පිළිබඳ අගය, එම සිද්ධියෙහි තොරතුරුවලට ඇති ඉල්ලුම මඟින් හේතු සහගතව නිශ්චය කළ හැක.

මෙම මෙහෙවරට සම්බන්ධව ඉහත කවර වගන්තියක්/වගන්ති වලංගු වේ ද?

1) A පමණි 2) C පමණි 3) A සහ B පමණි 4) B සහ C පමණි 5) A, B සහ C සියල්ලම

(2019, Q 32)

B)

1) දත්ත ජීවන චක්‍රයේ නිවැරදි පිළිවෙල දැක්වෙන්නේ,

i. දත්ත එක්රැස් කිරීම, දත්ත වලංගුකරණය, අභාවිත දත්ත ඉවත් කිරීම

ii. දත්ත නිර්මාණය, දත්ත කළමනාකරණය, අභාවිත දත්ත ඉවත් කිරීම

iii. දත්ත නිර්මාණය, දත්ත වලංගුකරණය, දත්ත ගබඩා කිරීම

iv. දත්ත එක්රැස් කිරීම, දත්ත සැකසීම, දත්ත ප්‍රතිදානය

v. දත්ත එක්රැස් කිරීම, අභාවිත දත්ත ඉවත් කිරීම, දත්ත වලංගුකරණය

2) ගුණාත්මක තොරතුරක ලක්ෂණ දැක්වෙන වරණය තෝරන්න.

i. අදාළ බව, කාලීන බව, නිවැරදි බව, අංග සම්පූර්ණ බව, තේරුම් ගැනීමේ හැකියාව

ii. අදාළ බව, පවතින බව, කාලීන බව, ප්‍රවේශ වීමේ හැකියාව, තේරුම් ගැනීමේ හැකියාව


iii. අදාළ බව, අංග සම්පූර්ණ බව, පවතින බව, නිවැරදි බව, තේරුම් ගැනීමේ හැකියාව

iv. අදාළ බව, කාලීන බව, නිවැරදි බව, අංග සම්පූර්ණ බව, තේරුම් ගැනීමේ හැකියාව


v. අදාළ බව, පවතින බව, නිවැරදි බව, අංග සම්පූර්ණ බව, තේරුම් ගැනීමේ හැකියාව

3) තොරතුරුවල ස්වර්ණමය න්‍යාය දැක්වෙන නිවැරදි ප්‍රස්ථාරික නිරූපණය වන්නේ,


I.




II.




III.



IV.



V.



4) දත්ත හා තොරතුරු හැසිරවීම සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.

A. දත්ත හා තොරතුරු සැකසීම සඳහා අත්යුරු ක්‍රමය සහ ස්වයංක්‍රීය ක්‍රමය යොදා ගත හැක.

B. දත්ත අසංගත බව, දත්ත අනුපිටපත් වීම, දෝෂ සහගත බව සහ තොරතුරුවල වැරදි සහගත බව අත්යුරු ක්‍රමයේ දී සිදුවිය නොහැකිය.

C. මිනිස් ජීවිතවලට අනතුරක් සිදුවිය හැකි අවස්ථාවල දී ස්වයංක්‍රීය ක්‍රමවේද භාවිතය වඩා ඵලදායක වේ.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

i. A පමණි. ii. A සහ B පමණි. iii. A සහ C පමණි

iv. B සහ C පමණි. v. A, B සහ C සියල්ල ම.

5) පද්ධතියක් සම්බන්ධව දැක්වෙන පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.

a. පද්ධතියක් යනු යම්කිසි අරමුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා එකිනෙකට සම්බන්ධ වී ක්‍රියා කරන සංඝටක සමූහයක එකතුවකි.

b. ආදානය, සැකසීම හා ප්‍රතිදානය ලෙස පද්ධතියක මූලික සංඝටක තුනකි.

c. පාසලක් යනු පද්ධතියක් සඳහා හොඳ උදාහරණයකි.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

i. A පමණි. ii. A සහ B පමණි. iii. B සහ C පමණි.

iv. A සහ C පමණි. v. A, B සහ C සියල්ල ම.

6) වළාකුළු පරිගණනය යනු ජාලයක් හෝ අන්තර්ජාලය වේ. වළාකුළක් දුරස්ථ ස්ථානයක තිබෙන අතර ජාලයක් හරහා සේවා සපයයි. A, B සහ C යනු වළාකුළු පරිගණනයේ සේවාවන් වේ. A, B සහ C සඳහා ගැළපෙන පිළිතුර පිළිවෙළින් දැක්වෙන්නේ,

i. යටිතල පහසුකම් සේවාවක් ලෙස ලබා දීම (IaaS), පසුතල සේවාවක් ලෙස ලබා දීම (PaaS), තොරතුරු සේවාවක් ලෙස ලබා දීම (IaaS)

ii. යටිතල පහසුකම් සේවාවක් ලෙස ලබා දීම (IaaS), පසුතල සේවාවක් ලෙස ලබා දීම (PaaS), මෘදුකාංග සේවාවක් ලෙස ලබා දීම (SaaS)

iii. පසුතල සේවාවක් ලෙස ලබා දීම (PaaS), තොරතුරු සේවාවක් ලෙස ලබා දීම (IaaS), ගබඩා පහසුකම් සේවාවක් ලෙස ලබා දීම (SaaS)

iv. යටිතල පහසුකම් සේවාවක් ලෙස ලබා දීම (PaaS), පසුතල සේවාවක් ලෙස ලබා දීම (IaaS), ගබඩා පහසුකම් සේවාවක් ලෙස ලබා දීම (SaaS)

v. පසුතල සේවාවක් ලෙස ලබා දීම (PaaS), තොරතුරු සේවාවක් ලෙස ලබා දීම (IaaS), ගබඩා පහසුකම් සේවාවක් ලෙස ලබා දීම (SaaS)

7) පරිගණක පද්ධතියක මූලික කාර්යයන් තොරතුරු පිළිබඳ ව්‍යුක්ත ආකෘතිය මත හොඳින් ගැළපේ. තොරතුරු පිළිබඳ ව්‍යුක්ත ආකෘතියෙහි සංරචක තුනකි. පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.

A- ආදානය B - ප්‍රතිදානය C - සැකසීම D - ගබඩා කිරීම

ඉහත A, B, C සහ D අතරින් නිවැරදි සංරචක දැක්වෙන වරණය වන්නේ,

i. A, B සහ C පමණි. ii. A, B සහ D පමණි. iii. A, C සහ D පමණි.

iv. B, C සහ D පමණි. v. ඉහත සංරචක කිසිවක් නොවේ.

8) පරිගණක පද්ධතියක පවතින දෘඩාංග වර්ග කිහිපයකි. ඒවා අතරින් මතක උපාංග දත්ත සහ උපදෙස් ගබඩා කිරීම සඳහා භාවිතා කරයි. පරිගණක මතකය කොටස් තුනකට වර්ගීකරණය කර ඇත. ඒවා දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.

i. වාරක මතකය, ප්‍රාථමික මතකය

ii. ප්‍රාථමික මතකය, තාවකාලික මතකය

iii. වාරක මතකය, ස්ථීර මතකය, තාවකාලික මතකය

iv. වාරක මතකය, ප්‍රාථමික මතකය, ද්විතියික මතකය

v. වාරක මතකය, ප්‍රධාන මතකය, නෂ්‍ය මතකය

vi. නෂ්‍ය මතකය, නෂ්‍ය නොවන මතකය, සහ තත්වයේ මතක උපාංග

9) පහත දැක්වෙන මතක වර්ග සලකන්න.

A. පයනමාත්‍ර මතකය B. ද්විතියික ආචයනය C. රෙජිස්තර මතකය

d. සැනෙලි මතකය E. සසම්භාවී ප්‍රවේශ මතකය F. වාරක මතකය

මෙම මතක වර්ග අතරින් නම්‍ය මතක වර්ග දැක්වෙන වරණය වන්නේ,

(1) A, B, C (2) A, B, D (3) B, C, D (4) C, E, F (5) D, E, F

10) මෘදුකාංග සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය කුමක් ද?

i. පද්ධති මෘදුකාංග සහ යෙදුම් මෘදුකාංග ලෙස මෘදුකාංග වර්ග දෙකකට බෙදේ.

ii. පරිගණක පද්ධතිය පාලනය කිරීමට සහ එහි මෘදුකාංග ක්‍රියාත්මක වීමට සහ පරිශීලකයාට පද්ධතිය සමඟ ගනුදෙනු කිරීමට අවශ්‍ය පහසුකම් සපයා දෙන්නේ යෙදුම් මෘදුකාංග මඟිනි.

iii. විවෘත මූලාශ්‍ර සහ බලපත්‍ර සහිත මෘදුකාංග වශයෙන් මෘදුකාංග වර්ග දෙකකට බෙදේ.

iv. භාෂා පරිවර්තක යනු පද්ධති මෘදුකාංග වන අතර ඒවා උපයෝගිතා මෘදුකාංග ගණයට අයත් වේ.

v. මෙහෙයුම් පද්ධති යනු පද්ධති මෘදුකාංග වන අතර ඒවා විධාන පේළි සහ චිත්‍රක පරිශීලක වශයෙන් වර්ග දෙකකි.

11) විවෘත කේත මෘදුකාංග සඳහා උදාහරණයක් නොවන්නේ,

I. Ubuntu ii. Isuru Linux iii. Microsoft Word iv. OpenOffice Calc v. GIMP

12) මුද්‍රක තුනක අභ්‍යන්තර ක්‍රියාවලි පහත වාක්‍ය ඛණ්ඩ මඟින් ලැයිස්තුගත කර ඇත.

1 චලනය වන මුද්‍රණ හිසක් මඟින් තීන්ත ආලේපිත පටියක් මුද්‍රණ කඩදාසියේ වැද්දවීම

2 සිලිණ්ඩරයක මුද්‍රණය වන දෙයට ටෝනර් ආකර්ෂණය වී ඒවා පසුව කඩදාසියට මාරු වීම

3 තුඩු මඟින් කඩදාසියට තීන්ත ඉසීම

ඉහත වාක්‍ය ඛණ්ඩ සමඟ තිත් න්‍යාස, තීන්ත විදුම් සහ ලේසර් මුද්‍රක නිවැරදිව ගළපා ඇත්තේ කවරක ද?

i. 1-තිත් න්‍යාස 2-ලේසර් 3- තීන්ත විදුම්

ii. 1-තිත් න්‍යාස 2- තීන්ත විදුම් 3- ලේසර්

iii. 1- තීන්ත විදුම් 2- තිත් න්‍යාස 3- ලේසර්

iv. 1- ලේසර් 2- තිත් න්‍යාස 3- තීන්ත විදුම්

v. 1- ලේසර් 2- තීන්ත විදුම් 3- තිත් න්‍යාස

13) දත්ත රැස් කිරීමේ පියවර නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය වන්නේ,

i. දත්ත රැස් කිරීම, දත්ත සැකසුම, දත්ත ප්‍රතිදානය, දත්ත වලංගුකරණය, දත්ත ආචයනය

ii. දත්ත රැස් කිරීම, දත්ත ප්‍රතිදානය, දත්ත සැකසුම, දත්ත ආචයනය, දත්ත වලංගුකරණය

iii. දත්ත වලංගුකරණය, දත්ත රැස් කිරීම, දත්ත ප්‍රතිදානය, දත්ත සැකසුම, දත්ත ආචයනය

iv. දත්ත වලංගුකරණය, දත්ත සැකසුම, දත්ත රැස් කිරීම, දත්ත ප්‍රතිදානය, දත්ත ආචයනය

v. දත්ත රැස් කිරීම, දත්ත වලංගුකරණය, දත්ත සැකසුම, දත්ත ප්‍රතිදානය, දත්ත ආචයනය

14) දත්ත රැස් කිරීම සඳහා භාවිතා වන හස්තීය ක්‍රමයක් ලෙස .....A..... දැක්විය හැකි අතර ස්වයංක්‍රීයව ලිඛිත හෝ මුද්‍රිත ලේඛනයක් පරිගණකගත කිරීමට .....B..... භාවිතා කළ හැකිය. විශේෂයෙන් නිර්මාණය කරන ලද ලේඛනයක් මත සලකුණු කර ඇති පැන්සල් ලකුණු කියවීමට .....C..... යොදා ගනී. වෙක්පතක පහළ කොටසේ ඇති අංක කියවා එහි ඇති තොරතුරු පරිගණකය වෙත ආදානය කිරීමට ...D..... භාවිතා කරන අතර ණයපත් සහ බැංකු කාඩපත් මත ඇති චුම්බක තීරුවේ ගබඩා කර ඇති දත්ත කියවීමට .....E..... යොදා ගත හැක. මෙම ඡේදයේ පිළිවෙළින් A, B, C, D සහ E සඳහා සුදුසුම වරණය දැක්වෙන පිළිතුර තෝරන්න.

i. ප්‍රකාශ සලකුණු සංජානනය (OMR), චුම්බක පටි කියවනය (Magnetic Strip reader), සම්මුඛ සාකච්ඡා (Interviews), ප්‍රකාශ අක්ෂර සංජානනය (OCR), චුම්බක තීන්ත අනුලක්ෂණ කියවනය (MICR)

ii. ප්‍රකාශ අක්ෂර සංජානනය (OCR), චුම්බක පටි කියවනය (Magnetic Strip reader), සම්මුඛ සාකච්ඡා (Interviews), චුම්බක තීන්ත අනුලක්ෂණ කියවනය (MICR), ප්‍රකාශ සලකුණු සංජානනය (OMR)

iii. චුම්බක තීන්ත අනුලක්ෂණ කියවනය (MICR), ප්‍රකාශ සලකුණු සංජානනය (OMR), සම්මුඛ සාකච්ඡා (Interviews), ප්‍රකාශ අක්ෂර සංජානනය (OCR)

iv. චුම්බක පටි කියවනය (Magnetic Strip reader), චුම්බක තීන්ත අනුලක්ෂණ කියවනය (MICR), ප්‍රකාශ සලකුණු සංජානනය (OMR), සම්මුඛ සාකච්ඡා (Interviews), ප්‍රකාශ අක්ෂර සංජානනය (OCR)

v. සම්මුඛ සාකච්ඡා (Interviews), ප්‍රකාශ අක්ෂර සංජානනය (OCR), ප්‍රකාශ සලකුණු සංජානනය (OMR), චුම්බක තීන්ත අනුලක්ෂණ කියවනය (MICR), චුම්බක පටි කියවනය (Magnetic Strip reader)

15) පහත කවරක් කාණ්ඩ සැකසුම (batch processing) සඳහා හොඳ උදාහරණයක් වේද?

i. ගුවන් යානා පාලක (air traffic control) පද්ධතියක්

ii. රියදුරු රහිත මෝටර් කාරයක (autonomous car) පවතින ධාවන පද්ධතිය

iii. දැඩි සත්කාර ඒකක (ICU) රෝගීන් නිරීක්ෂණ හා සත්කාර පද්ධතිය

iv. වේතන සැකසීමේ (payroll) පද්ධතිය

v. න්‍යෂ්ටික බලාගාර පාලන පද්ධතිය